# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2324/27 – 2023 මාර්තු මස 22 වැනි බදාදා – 2023.03.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2015/186.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2017.03.27 දිනැති හා අංක 2012/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2017.03.09 වැනි දින දරන නියෝග යෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. අගලවත්ත, උඩවෙල පදිංචි ජී.කේ. සුදත් කුමාර මයා. 2. පෝරුව දණ්ඩ, මාපුටුව, හොරහේන, වෙන්දේසිවත්ත, මදාරා හි පදිංචි එස්.වී. තුෂාරි ප්‍රියංගිකා මිය. 3. කුරුණෑගල, වළාකුළුපොල, පදිංචි නයනා දර්ශනී රාජපක්ෂ මිය. 4. පිළියන්දල, සිද්ධමුල්ල, ජනසවි මාවත, අංක 28/21 හි පදිංචි සඳකැළුම් ප්‍රභා ද සිල්වා මයා. 5. කුරුණෑගල, දොරටියාව, කෝන්පොල පාර, එවර්ග්‍රීන් ගාර්ඩ්න්, අංක 11 හි පදිංචි කේ.ඩබ්.එම්. චන්දිමා ප්‍රියදර්ශනී මිය සහ කොළඹ 02, වොක්ස්හෝල් පටුමඟ, අංක 55/75 හි පිහිටි තුරුසවිය අරමුදල අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.01.26 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 පෙබරවාරි මස 27 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 039163 – 11 (2023/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම් කිරීමේ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය**

නඩු අංකය : A/16/2017.
ආරාවුල් අංකය : IR/COM/01/P/2015/186.

එක් පාර්ශ්වයක් වශයෙන්

1. ජී.කේ. සුදත් කුමාර මයා,
උඩවෙල, අගලවත්ත.

2. එස්.වී. තුෂාරි ප්‍රියංගිකා මිය,
"මදාරා" , හොරහේන,
වෙන්දේසි වත්ත, මාපුටුගල,
පෝරුවදණ්ඩ.

3. නයනා දර්ශනී රාජපක්ෂ මිය,
වළාකුළු පොල, කුරුණෑගල.

4. සඳකැළුම් ප්‍රභා ද සිල්වා මිය,
නො. 28/21 ජනසවි මාවත,
සිද්ධමුල්ල, පිළියන්දල.

5. කේ.ඩබ්.එම්. චන්දිමා,
ප්‍රියදර්ශනී මිය,
නො. 11, එවර් ග්‍රීන් ගාර්ඩන්,
කෝන්පොල පාර,
දොරටියාව, කුරුණෑගල.

අනෙක් පාර්ශ්වය වශයෙන්,

තුරුසවිය අරමුදල,
නො. 55/75,
වොක්ස්හෝල් පටුමඟ,
කොළඹ 02.

අතර ඇති කාර්මික ආරාවුල

## ප්‍රදානය

ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් කම්කරු හා වෘත්තීය පුහුණු අමාත්‍යවරයාට පැවරී ඇති බලතල අනුව අමාත්‍යවරයා විසින් ඉහත සඳහන් පාර්ශ්වයන් දෙක අතර වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2017.03.09 වන දින මා පත් කරන ලදී.

කම්කරු කොමසාරිස් විසින් IR/COM/01/P/2015/186 යටතේ 2017.03.02 වන දින ගොණු කරන ලද ලේඛණය අනුව ඉහත නම් සඳහන් පාර්ශ්වයන් දෙක අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

"තුරුසවිය අරමුදල මගින් 2002 වර්ෂයේ දී කොන්ත්‍රාත් පදනම් යටතේ සේවයට බඳවා ගත් ජී.කේ. සුදත් කුමාර, එස්. වී. තුෂාරි ප්‍රියංගිකා, නයනා දර්ශනී රාජපක්ෂ, සඳ කැළුම් ප්‍රභා ද සිල්වා, කේ.ඩබ්.එම්. චන්දිමා ප්‍රියදර්ශනී යන සේවකයින් පස්දෙනා ඔවුන් කොන්ත්‍රාත් පදනම යටතේ සේවයට බඳවා ගත් දින සිට හා/හෝ අදාළ අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කළ දින සිට වැටුප් වර්ධක උපයා ගත්තා

සේ සළකා වැටුප් තලවල පිහිටුවා ඔවුන්ගේ තනතුරු පෙරදාතම් කර ස්ථිර කිරීමෙන් පසුව එම වැටුප් පරිවර්තන වැරදි ලෙස සිදුකර ඇතැයි දක්වා වැඩිපුර ගෙවන ලද වැටුප් අඩුකර, වැටුප් ගෙවීමට තුරුසවිය අරමුදල කටයුතු කිරීම තුළින් ඔවුන්ට අසාධාරණයක් සිදු වූයේ යැයි එම සේවක පිරිස විසින් කරණු ලබන ඉල්ලීම් යුක්ති සහගත වන්නේ ද යන්න සහ එසේ යුක්ති සහගත වන්නේ නම් ඔවුන් එකිනෙකා වෙත වෙන වෙනම හිමි විය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ".

ඉල්ලුම්කරුවන් පස්දෙනා 2017.04.06 දින සිය ඉල්ලීමට අදාළව කරුණු ගොණු කරමින් ප්‍රකාශ කරන ලද්දේ දෙවන පාර්ශ්වය වූ තුරුසවිය අරමුදල 2002 වසරේ දී ඉල්ලුම්කරුවන් කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගන්නා ලද බවත් සේවයට බඳවා ගන්නා ලද දින සිට පෙරදාතමින් සේවය ස්ථිර කරන ලද බවය. ඉල්ලුම්කරුවන් වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ එසේ සේවය ස්ථිර කිරීමේ දී වැටුප් වර්ධක උපයාගත් සේ සලකා වැටුප් ගණනය කර නියමිත වැටුප් තලයක පිහිටුවන ලද බවය. එම පදනම මත මාස කීපයක් වැටුප් ගෙවීමෙන් පසු දෙවන පාර්ශ්වය වන තුරුසවිය අරමුදල ඉල්ලුම්කරුවන්ට දන්වා ඇත්තේ වැටුප් ගණනය කිරීමේ වරදක් සිදු වී ඇති නිසා වැටුප් වර්ධක ඉවත් කර ආරම්භක පියවරේ තබා වැටුප් සකස් කරන බවත්, වැඩිපුර ගෙවා ඇති මුදල් වැටුපෙන් අඩු කිරීමට තීරණය කරන ලද බවත් ය. මේ නිසා තමන්ට අසාධාරණයක් සිදුවී ඇති බව ප්‍රකාශ කරන ඉල්ලුම්කරුවන් මෙම කරුණට අදාළ ලේඛන කීපයක් ද සිය ඉල්ලීම සමග ගොණු කර තිබුණි.

දෙවන පාර්ශ්වය වන තුරුසවිය අරමුදල 2017.05.16 වන දින එම කරුණට අදාළව විස්තර ප්‍රකාශයක් ගොණු කරමින් ප්‍රකාශ කරන ලද්දේ ඉල්ලුම්කරුවන් කොන්ත්‍රාත් පදනමින් කටයුතු කල කාලයට අදාළ වැටුප් වර්ධක ලබා දී සේවය ස්ථිර කිරීම කළමණාකරන මණ්ඩලය ගත් වැරදි තීරණයක් බවත් ඒ නිසා ඉල්ලුම්කරුවන් නියමිත වැටුප් ප්‍රමාණයේ තබා වැඩිපුර ගෙවා ඇති වැටුප් අඩු කර ගැනීමට කටයුතු කරන ලද බවය. එම විස්තර ප්‍රකාශය සමග ලේඛන 12ක් ඇමුණුම් ලෙස ලකුණු කර ගොණු කර තිබුණි.

දෙපාර්ශ්වය අතර ඇති ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීමට හැකියාවක් තත්වයක් නොතිබූ නිසා සාක්ෂි විමසීමට තීරණය කලෙමි. ඒ අනුව 2017.09.08 දින ඉල්ලුම්කාරියක වන සඳ කැළුම් ප්‍රභා ද සිල්වා මහත්මිය සාක්ෂි දෙන ලදී. අනතුරුව ඉල්ලුම්කරුවකු වන සමරසිංහ විදානෙලාගේ තුෂාරි ප්‍රියංගිකා ද සාක්ෂි දුන් අතර දෙවන පාර්ශ්වය වෙනුවෙන් ඔවුන්ගෙන් හරස් ප්‍රශ්න අසන ලදී. එම සාක්ෂි වලදී පැ 1 සිට පැ 22 දක්වා ලේඛණ ද ලකුණු කර ඉදිරිපත් කරන ලදී. දෙවන පාර්ශ්වය වෙනුවෙන් එම අරමුදලේ සභාපති ද ගණකාධිකාරීවරයා ද කළමනාකාර දෙපාර්තමේන්තුව වෙනුවෙන් සංවර්ධන නිලධාරි දීපලාල් සමරවික්‍රම මහතා ද සාක්ෂි දුන් අතර ඔවුන්ගේ සාක්ෂි ඉල්ලුම්කාර පාර්ශ්වයෙන් හරස් ප්‍රශ්න වලට ද භාජනය කරන ලදී. දෙවන පාර්ශ්වය සිය සාක්ෂි වලදී ව1 සිට ව24 දක්වා ලේඛණ ද ලකුණු කරන ලදී. අනතුරුව දෙපාර්ශ්වයම ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන ලදී. මෙම කාරණය පිළිබඳව නිගමනයකට පැමිණියේ දෙපාර්ශවය විසින් දෙන ලද සාක්ෂි ද ලේඛණ ද, ලිඛිත දේශන ද සැලකිල්ලට ගෙනය.

2002 වසරේ සිට කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ලද ඉල්ලුම්කරුවන් 2012.12.18 වන දින කළමණාකරන මණ්ඩල රැස්වීමේ දී ගන්නා ලද තීරණයක් අනුව සේවය ස්ථිර කර ඇත. එම ස්ථිර කිරීමට අදාළ ලේඛණය ඉල්ලුම්කාරියක වන සඳ කැළුම් ප්‍රභා ද සිල්වා මහත්මියගේ සාක්ෂියේ දී පැ1 ලෙස සලකුණු කර ලදී.

පැ1අ ලෙස සලකුණු කරන ලද කොටසේ මෙසේ සඳහන් වේ.
"එස්.වී. තුෂාරි ප්‍රියංගිකා මහත්මිය, නයනා දර්ශනී රාජපක්ෂ මහත්මිය, චන්දිමා ප්‍රියදර්ශනී මහත්මිය, සඳ කැළුම් ප්‍රභා ද සිල්වා මහත්මිය සේවයට බඳවා ගත් දින සිට සේවයේ ස්ථිර කිරීම අනුමත කරන ලදී.

සුදත් කුමාර ගලබඩ මහතා අදාළ අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කල දින සිට (2003.01.01 දින සිට සේවයේ ස්ථිර කිරීමට කළමණාකරන මණ්ඩලය අනුමැතිය ලැබුණි.) එසේම එම ලේඛනයේ වැඩි දුරටත් සඳහන් වන්නේ,

"පැ1 ආ ස්ථිර කිරීමේ දී වැටුප් පියවරේ තැබීමේ දී ස්ථිර කල දින සිට වැටුප් වර්ධක උපයා ගත් සේ සලකා වැටුප් පියවරේ තැබිය යුතුය... යනුවෙනි.

ඉල්ලුම්කරුවන්ගේ සාක්ෂියේ දී පැ2 ලෙස ලේඛණයක් සළකුණු කරන ලදී. එය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් විසින් තුරුසවිය අරමුදලට පිටපතක් ද සහිතව අධ්‍යක්ෂ ජෙනරාල් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කරන ලද ලිපියකි. 2012.09.10 දාතමින් ලියා ඇති එම ලිපියේ,

තුරුසවිය අරමුදලේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධාරීන් ස්ථිර කිරීම එම ලිපියේ ඉල්ලුම්කරුවන් 5 දෙනාගේ නම් ද ඇතුළත්ව ඇත.

එම ලිපියේ වැඩි දුරටත් මෙසේ සඳහන් වේ. "2002 වසරේ සිට වසර 10 ක පමණ දීර්ඝ කාලයක් කොන්ත්‍රාත් සේවා කාලය වරින්වර දීර්ඝ කරමින් මෙම නිලධාරීන් සේවයේ යොදවා ඇති බැවින් බඳවා ගන්නා අවස්ථාවේ කුඩා තේවතු සංවර්ධන අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටිය සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති හා බඳවා ගැනීමෙන් පසු සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන් සේවයේ

ස්ථිර කිරීම නිර්දේශ කරන අතර ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලෙස කාරුණිකව ඉල්ලමි."

එයින් පැහැදිලි වන්නේ මෙම සේවකයින් ස්ථිර කිරීම පිළිබඳව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයත් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවත් දැනුවත්ව සිටි බවයි.

සහකාර සමිති ප්‍රවර්ධන නිලධාරි තනතුරට පත් කිරීම යනුවෙන් සඳහන් කරමින් ඉල්ලුම්කාරියක වන සඳ කැළුම් ප්‍රභා ද සිල්වා මහත්මියට 2012.12.20 වන දාතමින් තුරුසවිය අරමුදලේ සභාපති විසින් නිකුත් කරන ලද පත්වීම් ලිපිය පැ3 ලෙස සලකුණු කරන ලදී.

එම ලිපියේ අංක 2 යටතේ,

මාසික ඒකාබද්ධ වැටුප් ක්‍රමය රු. 13,450.00/10X145-7X170<br>-12X290-12X345=23,710.00 වේ.

2013.01.01 වන දින සිට මෙම වැටුප් ක්‍රමය රු. 14,925/-ක් වූ පියවරෙහි තබනු ලැබේ.

3. මෙම තනතුර ස්ථිර ය.

ස්ථිර කිරීමේ දී ලබාදෙන පත්වීමේ ලිපියක අඩංගු අනෙකුත් කරුණු එහි අඩංගු කර ඇත. එම මහත්මිය 2013.01.11 දින ලබාදුන් ලිපියට අනුව (2012.12.20 දිනැති පත්වීමේ ලිපියට වැඩිමනත්ව)

"කළමණාකරණ සේවා චක්‍රලේඛ 30/1 අනුව 14,925 වැටුප සංශෝධනය කර 2013.01.01 දින සිට රු. 15,240/- ක පියවරේ තබනු ලැබේ. එම මහත්මිය වෙත ලබා දී ඇති 2014.01.01 දිනැති ලිපියෙන් (පැ5) "මාසික ඒකාබද්ධ වැටුප 2014.01.01 දින සිට ඔබ මෙම වැටුප් ක්‍රමයේ රු. 18,120.00 පියවරේ තබනු ලැබේ." යනුවෙන් සඳහන් කර ඇත. දෙවන පාර්ශ්වය විසින් ව8 ලෙස ලකුණු කරන ලද 2012.12.20 දාතමින් ඉල්ලුම්කාරියක වන නයනා දර්ශනී රාජපක්ෂ මහත්මිය "ලිපිකාර තනතුරට පත් කිරීම" නම් වූ ලිපිය කෙරේ ද ව9 ලෙස ලකුණු කරන ලද 2012.12.20 දාතමින් චන්දිමා ප්‍රියදර්ශනී මහත්මියට නිකුත් කර ඇති කළමණාකරණ සහකාර (තාක්ෂණ නොවන) තනතුරට පත්කිරීම නම් වූ ලිපිය කෙරේ ද තවද පැ14 ලෙස ලකුණු කරන ලද සුදත් කුමාර මහතා වෙත හා පැ17 ලෙස ලකුණු කරන ලද තුෂාරි ප්‍රියංගිකා මහත්මිය වෙත යවා ඇති පත්වීමේ ලිපි කෙරේ ද අවධානය යොමු කරන ලදී.

මේ ආකාරයට ඉල්ලුම්කරුවන්ට පත්වීමේ ලිපි ලබා දී එම පත්වීම් ලිපිවල ඔවුන්ට හිමි වැටුප් ක්‍රමය ද අඩංගු කර එම වැටුප් ක්‍රමයට අනුව වැටුප් ගෙවීම සිදුකර ඇත. දෙවන පාර්ශ්වය ප්‍රකාශ කරන්නේ එසේ ඉල්ලුම්කරුවන්ට ගෙවන වැටුප නිවරදි නොවන බව පසුව අවබෝධ වූ බවය. දෙවන පාර්ශ්වය වන තුරුසවිය අරමුදලේ සභාපති විසින් ගොණු කරන ලද මූලික සාක්ෂි අඩංගු දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ මෙම සේවකයින් ස්ථිර කිරීම සඳහා කළමණාකාර සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන තිබූ නමුත් ස්ථිර කරන ලද දින සිට වැටුප් වර්ධක උපයාගත් ලෙස සලකා වැටුප් පියවරේ තැබීම සම්බන්ධයෙන් කිසිදු අනුමැතියක් ලබාගෙන නොතිබූ බවය. පසුව මේ සම්බන්ධයෙන් කළමණාකරණ දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමෙන් පසු මෙම සේවකයින් ස්ථිර කිරීමේ දී සිදුකර ඇති වැටුප් පරිවර්තන නිවරදි නොවන බවත් ඒ නිසා නියමිත වැටුප් පියවරේ තබා වැටුප් පරිවර්තනය සිදු කර වැඩිපුර ගෙවන ලද වැටුප අය කර ගැනීමට එම දෙපාර්තමේන්තුව දැනුම් දුන් බවත් සභාපතිවරයා ප්‍රකාශ කර සිටී. මෙම කරුණට අදාළව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ද විගණකාධිපති දෙපාර්තමේන්තුව ද එවන ලද ලිපි ව11 හා ව12 ලෙස සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

2014.05.02 දින පැවති කළමණාකරණ මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත්තේ මෙම සේවකයන් ස්ථිර කිරීම සම්බන්ධයෙන් 2012.12.18 වන දින පැවති එම මණ්ඩලයේ රැස්වීමේ දී ගන්නා ලද තීරණය වැරදි සහගත එකක් බවය. දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද ව්14 ලේඛණයේ 2014.05.02 වන දින කළමනාකරණ මණ්ඩලය ගන්නා ලද තීරණය මෙසේ දැක්වේ.

"මීට අමතරව 2012.12.18 දින පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීමේ දී 73:12:569 තීරණයට අනුව කොන්ත්‍රාත් පදනම මත සිටි සේවකයින් 2013.01.11 දින සිට ස්ථිර කිරීමේ දී ඔවුන් කොන්ත්‍රාත් පදනම මත සිටි සේවා කාලයට අදාළව බඳවා ගත් දින සිට වැටුප් වර්ධක උපයාගත් ලෙස සලකා වැටුපට එකතු කර වැටුප් ලබාදීමට කරන ලද තීරණය වැරදි සහගත තීරණයක් බැවින්.. අප්‍රමාදව එම වැටුප් වර්ධක ඉවත් කර ආරම්භක වැටුප් පියවරේ තබා වැටුප් සකස් කරන ලෙසත් වැඩිපුර ගෙවන ලද වැටුප් ඔවුන්ගේ වැටුපෙන් එකවර අඩුකර ගන්නා ලෙසත් තීරණය කරන ලදී."

අනතුරුව දෙවන පාර්ශ්වය වන තුරුසවිය අරමුදලේ ගණකාධිකාරී විසින් 2016.05.20 දාතමින් ඉල්ලුම්කරුවන් තිදෙනෙකු වන එස්.වී.ටී. ප්‍රියංගිකා, ජී.කේ.එස්. කුමාර හා නයනා දර්ශනී යන මහත්ම මහත්මීන් වෙත වැඩි දුර ගෙවා ඇති වැටුප් අය කර ගැනීම" යනුවෙන් සඳහන් කරමින් ඒවා ඇති ලිපියේ සඳහන් කර ඇත්තේ "ඔබ තිදෙනා විසින් වැඩිපුර ලබාගෙන ඇති වැටුප් ප්‍රමාණය රු. 200,367.00 කි. එම මුදල සමාන වාරික 27කින් වාරිකයක් රු. 8,348.65 බැගින් ඔබගේ මාසික වැටුපෙන් අය කර ගැනීම සඳහා කටයුතු කර ඇති බව මෙයින් දන්වමි." (පැ19)

එසේම ගණකාධිකාරී විසින් ඉල්ලුම්කරුවන් දෙදෙනෙකු වන එස්.පී.එස්. ද සිල්වා හා චන්දිමා ප්‍රියදර්ශනී මහත්මීන් වෙත 2016.05.20 දාතමින් වැඩිපුර ගෙවා ඇති වැටුප් අයකර ගැනීම යනුවෙන් සඳහන් කර ඇති ලිපියේ සඳහන් කර ඇත්තේ "ඔබ දෙදෙනා විසින් වැඩිපුර ලබා ගෙන ඇති වැටුප් ප්‍රමාණය රු. 59,877.75 කි. එම මුදල සමාන වාරික 9කින් වාරිකයක් රු. 6,652.42 බැගින් ඔබගේ මාසික වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කර ඇති බව මෙයින් දන්වමි. (පැ13) ගණකාධිකාරී විසින් ඒවා ඇති එක් එක් සේවකයා වැඩිපුර ලබා ගෙන ඇති මුදල කොපමණද යන්න එම ලිපිවල වෙන් වෙන් වශයෙන් සඳහන් කර නොතිබීම පෙන්නුම් කෙරෙන්නේ එම නිලධාරියා නිසි වගකීමකින් කටයුතු කර නොමැති බවය. ඒ අනුව ක්‍රියාත්මක වී ඇති දෙවන පාර්ශ්වය ඉල්ලුම්කරුවන්ගේ මාසික වැටුපෙන් Less over Payment යටතේ මුදල් අඩු කරගෙන ඇත. ඒ බව සනාත කිරීම සඳහා ඉල්ලුම්කරුවකු වන ජී.කේ.එස්. සුදත් කුමාර මහතාගේ වැටුප් වාර්ථාවත් පැ18 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. මෙසේ ඉල්ලුම්කරුවන් පස් දෙනාගේම වැටුපෙන් මුදල් අඩු කර ගැනීම සිදු කළ බව ඉල්ලුම්කරුවන් ප්‍රකාශ කර සිටිති.

මෙහිදී සිදු වී ඇත්තේ සේවකයෙකු උපයාගත් වැටුපෙන් කොටසක් අඩුකර ගැනීමකි. එවැනි අඩු කිරීමක් කිරීමට පුද්ගලයෙකුට හෝ ආයතනයකට නීතිමය වශයෙන් බලයක් තිබේ ද? යන්න පිළිබඳව අවධානය යොමු කළෙමි. සේවකයෙකුගේ වැටුපෙන් මුදලක් අඩු කිරීම කළ හැක්කේ එවැනි අඩුකිරීමක් සඳහා නීත්‍යානුකූල බලයක් ඇති අවස්ථාවක ය. උදා: සේවක අර්ථසාධක අරමුදලට මුදල් අඩු කිරීම. මෙම සේවකයින් පස් දෙනාගේ වැටුපෙන් මුදල් අඩු කිරීමට දෙවන පාර්ශ්වයට එවැනි නීත්‍යානුකූල පදනමක් තිබෙන බවක් නොපෙනේ. එසේම මෙම සේවකයන්ට ලබා දී ඇති පත්වීම් ලිපිවල යම් වැටුප් ක්‍රමයක් සඳහන් කර ඇත. එහි දී එම පත්වීම් ලිපිවල සඳහන් වැටුප් ක්‍රමය සංශෝධනය කර නොමැත. එම පත්වීම් ලිපි එසේම තිබියදී එහි අඩංගු වැටුප් ප්‍රමාණයන් අඩු කිරීමට දෙවන පාර්ශ්වය ගෙන ඇති ක්‍රියා මාර්ගය කිසිසේත් යුක්ති සහගත නොවේ.

ඒ අනුව සිය වැටුපෙන් මුදල් අඩු කිරීමට කටයුතු කිරීම මගින් තමන්ට අසාධාරණයක් සිදුවී ඇති බවට පළමු පාර්ශ්වයේ සේවකයින් කර ඇති ඉල්ලීම යුක්ති සහගත බව තීරණය කරමි.

එසේනම් එම සේවකයන්ට වෙන වෙනම හිමි විය යුතු සහනය කවරේ ද යන්න තීරණය කිරීමේ දී පහත සඳහන් කරුණු පදනම් කර ගත්තෙමි.
වැඩිපුර ගෙවා ඇති වැටුප් අඩුකර ගැනීම යනුවෙන් සඳහන් කරමින් ඉල්ලුම්කරුවන් තිදෙනෙකුට එනම් එස්.වී.ටී.ප්‍රියංගිකා, ජී.කේ.එස්. කුමාර සහ නයනා දර්ශනී වෙත එවා ඇති ලිපිය අනුව ඔවුන් තිදෙනාට වැඩිපුර ගෙවා ඇති මුදල ලෙස සඳහන් කර ඇත්තේ රු. 200,367.00 ක මුදලකි. එසේම එස්.පී. ද සිල්වා හා චන්දිමා ප්‍රියදර්ශනී වෙත එවා ඇති ලිපියේ සඳහන් කර ඇති මුදල රු. 59,871.71කි. ඉල්ලුම්කරුවන්ගේ පැමිණිල්ල ඉදිරිපත් කරන විට වාරික වශයෙන් ඔවුන්ගේ වැටුපෙන් එම මුදල් අය කර ගැනීම සිදු කරමින් තිබුණි. එම ලිපි වල සඳහන් කර තිබුණේ වාරික 24කින් එම මුදල් අඩු කර ගන්නා බවයි. මේ වන විට වසර කීපයක් ගත වී ඇති නිසා වැඩිපුර ලබා ගෙන ඇතැයි දෙවන පාර්ශ්වය සඳහන් කරන මුදල් ප්‍රමාණයන් සේවකයින්ගෙන් අයකර ගැනීම සම්පූර්ණ කර ඇති බවට නිගමනය කල හැකිය. ඉල්ලුම්කරුවන්ගේ වැටුපෙන් මුදල් අඩු කිරීම යුක්ති සහගත නොවන බව දැනටමත් තීරණය කර ඇති නිසා එසේ අඩු කරගෙන ඇති මුදල එම සේවකයින්ට ආපසු ගෙවන ලෙස දෙවන පාර්ශ්වයට නියම කරමි. දෙවන පාර්ශ්වය වන තුරුසවිය අරමුදලේ ගණකාධිකාරිවරයා එම සේවකයින් වැඩි පුර ලබා ගෙන ඇති වැටුප් ප්‍රමාණයන් සඳහන් කර ඇත්තේ අවිධිමත් හා අපැහැදිලි ලෙසය. එනම් සේවකයින් තිදෙනෙකු ලබා ගෙන ඇතැයි කියන වැටුප් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් නොව එකතුවක් ලෙසත් සේවකයින් දෙදෙනෙකු ලබාගෙන ඇතැයි කියන වැටුප් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් නොව එකතුවක් ලෙසය.

ඒ අනුව මට තීරණය කල හැක්කේ,

එස්.වී.ටී. ප්‍රියංගිකා, ජී.කේ.එස්. කුමාර හා නයනා දර්ශනී රාජපක්ෂ යන සේවකයින්ගෙන් අය කර ගෙන ඇති රු. 200,367.00 ක මුදල ඔවුන් තිදෙනාට වෙන් වෙන් වශයෙන් ගණනය කර ඔවුන් තිදෙනාට ගෙවන ලෙසත් ඉල්ලුම්කරුවන් දෙදෙනෙකු වන එස්.පී. ද සිල්වා හා චන්දිමා ප්‍රියදර්ශනී යන දෙදෙනාගෙන් අය කරගෙන ඇති රු. 59,871.75ක මුදල ඔවුන් දෙදෙනාට වෙන් වෙන් වශයෙන් ගණනය කර ගෙවන ලෙසත් දෙවන පාර්ශ්වයට නියම කරයි. එම මුදලට අමතරව එම සේවකයින් පස්දෙනා වසර ගණනාවක් පීඩාවට පත්කිරීම වෙනුවෙන් එක් එක් අයෙකුට රු. 20,000 බැගින් වූ වන්දි ගෙවීමටද දෙවන පාර්ශ්වයට නියම කරමි. මෙම ඉල්ලුම්කාරියක වන සඳ කැළුම් ප්‍රභා ද සිල්වා මහත්මිය මිය ගිය බව වාර්තා විය. එම මහත්මිය මියගොස් ඇත්තේ මෙම විමර්ශන කටයුතු අවසන් වෙමින් පැවති අවස්ථාවකය. එම මහත්මියට හිමි සහනයන් එම මහත්මියගේ උරුමකරුවකුට ලබා ගත හැකි බව ද මෙම සේවකයින්ට කරන ලද ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත බව ද ප්‍රකාශ කරමි. ඉල්ලුම්කරුවන්ට හිමි මුදල් ගැසට් කර මසක් ඇතුළත දකුණු කොළඹ කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කිරීමට ද දෙවන පාර්ශ්වයට නියම කරමි.

නීතිඥ සරත් ලියනගේ,
බේරුම්කරු.

2023 ජනවාරි මස 26 වැනි දින දී ය.

EOG 03 - 0284

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.